Article 12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019-06-04

පැමිණිලි පාර්ශවය : ජේ.කේ.එම්.ඩී. ජයසුන්දර මිය.
260. කනත්ත පාර.
පෝරේ. අතුරුගිරිය.

වගඋත්තරකාර පාර්ශවය : 01. විදුහල්පතිනිය.
අනුලා විද්‍යාලය.
නුගේගොඩ.

02. ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය.
බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/3875/17**

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

උක්ත පැමිණිලිකාරිය විසින් 2017-12-14 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වන තමා ඉහත ලිපිනයෙහි පදිංචිව සිටින බවත්, 2017 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා තම දියණිය වන දුලාෂි දම්සරා වජිරන්දි දියණිය ආදි ශිෂ්‍ය ගණය යටතේ නුගේගොඩ අනුලා විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ නමුත් එහිදි ලකුණු ලබා දිමේදි

තමන් විසින් ඉහත ගණය යටතේ ඉදිරිපත් කර තිබූ ලේඛන සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා දිමට විදුහල්පතිනිය ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු නොකල බවත්, තවද තමාට වඩා අඩු ලකුණු ලබා සිටි අයදුම්කරුවන් වෙත අභියාචනා විරෝධතා පරීක්ෂාවේදි චක්‍රලේඛයට පටහැනිව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලකුණු ලබා දීම මගින් තම දියණියට එම වසරේ නුගේගොඩ අනුලා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත්. සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතද පැමිණිලි කර ඇතත්. ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති බවත් ඒ අනුව තම පැමිණිල්ල සම්බන්ධව කඩිනම් විමර්ශනයක් සිදු කර තම දියණිය නුගේගොඩ අනුලා විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම =:

01. විදුහල්පති. අනුලා විද්‍යාලය කරුණු දැක්වීම

පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන චෝදනා සම්බන්ධයෙන් 2018-05-14 දාතමින් ලිඛිත කරුණු දැක්වීමක් ලබා දෙමින් අනුලා විද්‍යාලයේ විදුහල්පතිනිය ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරියගේ දියණිය 2017 වසරේ ආදි ශිෂ්‍ය ගණය යටතේ තම පාසලට ඇතුලත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රය සලකා බැලීමෙන් අනතුරුව ලකුණු 25.5ක ප්‍රමාණයක් ලබා දී ඇති බවත්. එම සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී දැරිය ඇතුළු දෙමාපියන් විදේශ ගතව සිට ඇති බවත්. ඒ අනුව ඔවුන් විසින් බලය පවරන ලද අයකු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව ඇති බවත්. කෙසේ වෙතත් ඉහත ලකුණු ප්‍රමාණය ලබා සිටි පැමිණිලිකාරියගේ දියණිය තාවකාලික පොරොත්තු ලේඛණයේ 06 වන ස්ථානයේ රැඳී සිටි බවත් ප්‍රකාශ කර ඇත.

ඉන් අනතුරුව පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා බැලීමෙන් පසුව පැමිණිලිකාරියගේ දියණිය පොරොත්තු ලේඛණයේ 05 වන ස්ථානයට පත්ව ඇති බවත්. සඳහන් කර ඇත. තවද 2017 වර්ෂයේ අනුලා විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා අවසන් ලේඛනයේ නොපැමිණි දරුවන් තිදෙනෙකු සඳහා පුරප්පාඩු ඇති වූ බවත්. ඒ අනුව පොරොත්තු ලේඛනයේ 01 සහ 02 ස්ථාන ලබාගෙන සිටි දරුවන් පාසලට ඇතුලත් කර ගත් බවත්. පොරොත්තු ලේඛනයේ තෙවැනි ස්ථානය ලබා සිටි දැරිය වෙනත් පාසලකට ඇතුලත් කර ඇති බව අනාවරණය වීම මත එහි හතර වන ස්ථානයේ රැඳී සිටි දැරියට එම අවස්ථාව ලබා දී ඇති බවත්. සඳහන් කරයි. ඒ අනුව පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් කඩ වන ආකාරයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින් කටයුතු කර නොමැති බවත්. 17/2016 චක්‍රලේඛයට අනුව තමන් මෙහිදී කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම ලිඛිත කරුණු දැක්වීමට අමතරව අවස්ථා කිහිපයකදී වැඩිදුර විමර්ශනය සඳහා විදුහල්පතිනි.

අනුලා විද්‍යාලය නියෝජනය කරමින් පැමිණි නියෝජිතයින් විසින් ඉහත ස්ථාවරයේ සිටිමින් මෙම ප්‍රශ්නගත කාරණය සම්බන්ධව තම වාචික කරුණු දැක්වීම් ඉදිරිපත් කර ඇත.

02. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ජාතික පාසල්) ලිඛිත කරුණු දැක්වීම.

මෙම පැමිණිල්ලට අදාලව 2018-12-07 දාතමින් අධ්‍යක්ෂ. (ජාතික පාසල්) ජයන්ත වික්‍රමනායක මහතා විසින් ලබා දී ඇති ලිඛිත කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරියගේ දියණිය වන දුලාෂි දමසරා ඉඩමගොඩගේ දැරිය 2017 වර්ෂයේ නුගේගොඩ අනුලා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා ආදි ශිෂ්‍ය ගණය යටතේ යොමු කර තිබූ අයදුම් පත්‍රයට නියමිත ලකුණු ලබා දී නොමැති බවට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ අභියාචනය සම්බන්ධව සිදු කල විමර්ශනයේදී පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුව ඇති බව අනාවරණය වී ඇති බවත්. ඒ අනුව ඉහත දැරිය එම වර්ෂයේ අනුලා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීමට සුදුසු බවට තීරණය කර ඇති බවද. සඳහන් කර ඇත. කෙසේ වෙතත් ඉහත කරුණු දැක්වීමෙහි 02 වන ඡේදයේ සඳහන් පරිදි නියමිත ලකුණු ලබා නොදීම හේතුවෙන් පැමිණිලිකාරියගේ දියණියට අගතියක් සිදුව ඇති බවට පැමිණි නිගමනය මත අමාත්‍යාංශය මගින් එම දැරිය දෙහිවල ප්‍රෙස්බිටිරියන් විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බවත්. තවද විභාග වෙමින් පවතින මෙම පැමිණිල්ලේ කටයුතු අවසන් වීමෙන් පසුව මෙම ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් සුදුසු ඉදිරි පියවර ගත හැකි බවද වැඩිදුරටත් එම කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත.

විමර්ශනය –:

මෙම පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයේදී පැමිණිලි පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකාරියගේ දියණිය නුගේගොඩ අනුලා විද්‍යාලයට 2017 වසරේ ඇතුලත් කර නොගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ අභියාචනය පරිදි එහි විමර්ශන අංශය විසින් සිදු කර ඇති විමර්ශනයේදී පිළිගෙන ඇති පරිදි පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර තිබූ සහතික දෙකක් සඳහා ලකුණු හිමිවිය යුතු වුවත්. එම ලකුණු ලබා නොදීම මත පැමිණිලිකාරියගේ දියණියට ආදි ශිෂ්‍ය ගණය යටතේ ඉහත වසරේ අනුලා විද්‍යාලයට ඇතුලත් වීමට හැකියාව ලැබී නොමැති බවත්. ඒ අනුව අනුලා විද්‍යාලයේ පළමු හෝ දෙවන ශ්‍රේණි සඳහා ඇතුලත්ව අධ්‍යාපන ලැබීමට පැමිණිලිකාරියගේ දියණියට අවස්ථාව අහිමිව ගොස් ඇති බැවින්. 2019 වසරේ තුන්වන ශ්‍රේණිය සඳහා අනුලා විද්‍යාලයට ඇතුලත්ව අධ්‍යාපනය ලැබීමට කඩිනමින් අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

නිරීක්ෂණ, නිගමන හා යෝජනා :-

පැමිණිලිකාරිය විසින් මෙම පැමිණිල්ල 2017-12-14 දින ඉදිරිපත් කර ඇති අතර, 2017-12-28 දාතමින් කොමිෂන් සභාව මගින් පැමිණිලිකාරිය වෙත දන්වා ඇත්තේ, තෙමසකට වැඩි කාලයකට පසු පැමිණිල්ල ඉදිරිපත් කිරීම මත ඒ පිළිබඳව ක්‍රියා කළ නොහැකි බවත්, ප්‍රමාදය සඳහා සුවිශේෂී හේතු ඇතොත් නැවත සලකා බැලීමට හැකියාවක් ඇති බවත්ය. ඒ අනුව පැමිණිලිකාරිය විසින් 2018-01-10 දාතමින් අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) වෙත ඉදිරිපත් කර තිබූ අභියාචනය පරිදි නැවත විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව ඉහත පරිදි පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු දැක්වීම් සැලකිල්ලට ගැනීමේදි විශේෂයෙන් 2018-12-07 දිනැතිව අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම පරිදි මෙම ප්‍රශ්නගත කාරණයේදි පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුව ඇති බවට පිළිගෙන ඇති බැවින්, ඊට පිළියමක් ලෙස පැමිණිලිකාරියගේ දියණිය දෙහිවල ප්‍රෙස්බිටීරියන් විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහාද අනුමැතිය ලබා දී ඇති බව ප්‍රකාශ කර ඇති බැවින්, වගඋත්තරකාර පාර්ශවය විසින් මෙහිදි පැමිණිලි පාර්ශවයට අසාධාරණයක් සිදුව ඇති බව පිළිගෙන ඇත. කෙසේ වෙතත් පැමිණිලි පාර්ශවය තම දියණිය ප්‍රෙස්බිටීරියන් විදුහලට ඇතුලත් කර ගැනීමට කැමැත්තක් නොදක්වන අතර, තම දියණිය නුගේගොඩ අනුලා විදුහලේ 03වන ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙසට ඉල්ලා සිටියි.

මෙහිදි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම ප්‍රශ්නගත කාරණයේදි නුගේගොඩ අනුලා විද්‍යාලයේ 2017 පළමු ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩලය පැමිණිලිකාරිය වෙත 17/2016 චක්‍රලේඛය පරිදි ලබා දිය යුතු උපරිම ලකුණු ලබා දී නොමැති බව පිළිගෙන ඇත. ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය හට වගඋත්තරකාර විද්‍යාලය වෙත ඇතුලත් වීමට අවස්ථාව අහිමි වීම මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරියගේ දියණිය දුලාෂි දම්සරා වජිරන්දි දියණිය නුගේගොඩ අනුලා විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කිරීමට පියවර ගත යුතුය.

2019.07. 08 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ලේකම්.
   අධ්‍යාපන අමාත්‍යාංශය.
   ඉසුරුපාය. බත්තරමුල්ල.

2. ගරු අමාත්‍ය [illegible] ).
   අධ්‍යාපන අමාත්‍යංශය.
   ඉසුරුපාය. බත්තරමුල්ල.

B/